03/04/2011- ඉරිදා ලංකාදීප

**ගෝලීයකරණය සමඟ ගොඩනැගෙන අලුත් සමාජ රටාව - මිලින්ද මොරගොඩ**

ලෝක ඉතිහාසයේ විවිධ යුග පසුකරමින් ගෝලීයකරණය කරා වර්තමාන සමාජය ප්‍රවේශ වී සිටී. රටක ආර්ථිකය ගෝලීයකරණය හමුවේ පෙන්වන ලක්ෂණ ගැන අපට අවබෝධයක් ඇත. ගෝලීයකරණය සාමාජ ට බලපාන අන්දම හොඳින් අවබෝධකරගත යුතුව තිබේ. එය අලුත් අභියෝගයකි. විශ්ව ගම්මානය යන දැක්ම කරා වේගයෙන් ඇදී යමින් සිටින යුගයක ජාත්‍යන්තරයේ සිදුවීම් එදිනෙදා ජීවිතයට ඇති කරන වෙනස සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කිරීම කාලෝචිතය.

ලෝකය උණුසුම් කළ සීතල යුද්ධයක් පැවති කාලයක් තිබිණ. බලවත් රටවල් දෙකක් තම තමන්ගේ ශක්තිය එකිනෙකා සමග පෙන්වමින් සිටි කාලය මෙම සීතල යුද්ධය පැවති වකවානුවයි. එක්සත් ජනපදය හා සෝවියට් රුසියාව මෙම රටවල් දෙක යි. සීතල යුද්ධය සංකල්ප ගැටුමකි. එක්සත් ජනපදය ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි විශ්වාස කළේය. සෝවියට් රුසියාව කොමියුනිස්ට් පාලනය අනුගමනය කළ අතර ඔවුන්ගේ ආර්ථික ක්‍රමය ධනවාදය ට පටහැනි සමාජවාදී එකකි. එක්සත් ජනපදයේ ආර්ථික සංකල්පය වූයේ විවෘත ආර්ථිකයයි. මෙම කඳවුරු දෙක ලෝකය තුළ සීතල යුද්ධයක පැටලී සිටි අතර, මෙම පැති දෙකටම අයත් නොවූ දියුණු වන රටවල් ද කණ්ඩායමක් වශයෙන් එකතු වී සිටියේය. එය නොබැඳි ජාතීන් වශයෙන්ය. ධනවාදී හෝ වාමංශික කඳවුරට බැඳී නැති බව පෙන්වන නමුත් අවශ්‍ය ආධාර හා තාක්ෂණික සහාය වෙනුවෙන් ලෝකයේ සියලුම රටවල් එක්සත් ජනපදයට හෝ රුසියාවට එකතු වී සිටියේ වැඩි ප්‍රසිද්ධියකින් තොරවය.

ප්‍රජාතන්ත්‍රවාදය හා විවෘත ආර්ථිකය පැතිර යන්නට පටන් ගැනීම සමග සංවෘත ආර්ථික ඇතිව දැඩි බැමි වලින් සමාජය බැඳ දමා තිබුණ සෝවියට් රුසියානු කඳවුර බිඳ වැටිණ. ජාත්‍යන්තරය තුළ ඇති වෙමින් තිබුණ ආර්ථික දියුණුව සමග තම සමාජය තුළ එකී ග්‍රහණය තව දුරටත් පවත්වාගෙන යන්නට සෝවියට් රුසියාවට නොහැකි විය. සෝවියට් දේශයේ පසුබෑම සමග මෙම කඳවුරු දෙක අතර තිබුණ සීතල යුද්ධය ද අවසානය කරා ගමන් කළේය. ලෝකය පුරා විවෘත ආර්ථිකය හා ප්‍රජාතන්ත්‍රවාදය තවත් දුරට පැතිර ගියේය. ජාත්‍යන්තර විචාරකයෝ මෙම බිඳ වැටීම සමග ලෝක ඉතිහාසය අවසන් යැයි කියන්නට පටන් ගත්තේය. එක්සත් ජනපදයේ ප්‍රකට මහාචාර්යවරයෙකු වූ ෆැන්සිස් ෆුකියාමා මහතd - Francis Fukuyama "*The End of History and the Last Man*" නමින් කෘතියක් සම්පාදනය කර එය ලෝක ප්‍රජාව වෙත ඉදිරිපත් කළේය. තවත් ඇමරිකානු දේශපාලන විද්‍යාඥයෙකු වූ සැමුවෙල් හුන්ටින්ග්ටන් - Samuel Huntington "*The Clash of Civilizations and the Remaking of World Order* " නමින් තවත් කෘතියක් රචනා කරමින් ලෝකයේ ඉතිහාසය වෙනස් කරමින් රටවල් අතර ගැටුම අවසන් වන නමුත් ශිෂ්ඨාචාර අතර ගැටුම අවසන්විය නොහැකි බව එළිපිට ප්‍රකාශ කළේය.

සීතල යුද්ධය අවසන් වීම සමග ලෝකය එතෙක් බෙදී තිබුණ පිල් අවසන් විය. කඳවුරු වෙනස් වූ අතර එක්සත් ජනපදය ලෝකයේ එකම බලවතා බව සිතන්නට පටන් ගනිමින් තිබිණ. එනමුත් එය එසේ ම නොවේ. ස්වභාවිකවම එක තැනෙකින් බලය ගිලිහෙන විට තවත් තැන් ගණනාවකින් විවිධාකාරයේ බල කේන්ද්‍ර මෝදු වන්නට පටන් ගත්තේය. එය අලුත් ලෝකයකි.

බටහිර රටවල් වලට සෝවියට් දේශයෙන් බිඳුණ රටවල් ද එකතු වී යුරෝපීය සංවිධානය ශක්තිමත්විය. චීනය තමන්ට අනන්‍ය පාලන රාමුවක් සමග ආර්ථික වශයෙන් අවදි වෙමින් සිටී. පාලන ක්‍රමය ගැන ප්‍රශ්න ඇතත් ආර්ථික දියුණුව වේගවත්ය. ඉන්දියාව ලෝකයේ බලවත් රාජ්‍ය අතරට එකතු වෙන මගට අවතීර්ණ වී ඇත. සීතල යුද්ධය පැවති කාලයේ හමුදා පාලනයේ තිබුණ බ්‍රසීලය ප්‍රජාතන්ත්‍රවාදය සමග ඉදිරියට එමින් සිටී. මැදපෙරදිග කලාපයේ රටවල් බලයෙන් වැඩී තිබේ. ජපානය හා දකුණු අප්‍රිකාව වැනි රටවල් ද එකිනෙකට වෙනස් බලයකින් වැඩෙමින් ලෝක වාසීන්ගේ අවධානයට ලක්ව ඇත. මේ දැන් පවතින ලෝකයේ පෙනී සිටින බලවත් රටවල්ය. කලින් සපිරි බලයෙන් සිටි රටවල් දෙකක් වෙනුවට විශිෂ්ඨ බලයකින් යුතු රටවල් මතුවී තිබේ. ඇමරිකාව මේ අතරින් ඉහලින් සිටී. ඔවුන් යුධ ශක්තිය හා ආරක්ෂාවට වැය කරන වියදම අතින් ලෝකයේ සියලුම

රටවල් අභිබවා සිටින අතර මේ අලුතින් නැගෙන රටවල් එවැනි යුධ ශක්තියක් නැති නමුත් නොසලකා හැරිය හැකි බලවේග නොවේ.

දෙවන ලෝක යුද්ධය අවසානයේ දී බිඳ වැටුණු සමාජය යළි ගොඩනැගීම අරමුණු කරගෙන එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිවිය. එක්සත් ජාතීන් අතරින් එක්සත් ජනපදය, බ්‍රිතාන්‍ය, ප්‍රංශය, රුසියාව හා චීනය යන රටවලට නිශේධ බලය ඇත. දශක හතරකට කළින් නිශේධ බලය හිමිවන්නට තිබුණ සුදුසුකම අද සහමුලින්ම වෙනස් එකක් බවට පත්ව තිබේ. නිශේධ බලය හිමි විය යුතු රටවල් කවරේද, එය තව දුරටත් අවශ්‍යද? යන්න තීරණය කිරීමට අපහසු වන තරමට ලෝකයේ බල කේන්ද්‍ර එකිනෙකට වෙනස්ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිශේධ රටවල් වලට අමතරව පත්කරන විශේෂ සාමාජික රටවල් එකතු වී ලෝක බල අරගලය පාලනය කරන භූමිකාවට ඇතුල් වී සිටී. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයට සුවිශේෂී වගකීමක් හිමිවන්නේ මේ අනුවය. ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ආයතන බිහිවී දෙවන ලෝක යුද්ධයෙන් සිදුවූ හානි වලින් පසු යළි ගොඩනැගීම අරඹයි.

සීතල යුද්ධය අවසන් වී බල අරගලය අවසන් වීම, ඒ සමග වෙනස් බලකේන්ද්‍ර ඇති වීම පමණක් නොව මෙතෙක් කල් රාජ්‍ය වශයෙන් පැවති භූමි සීමා අවසන් වී ලෝකය ගෝලීයකරණයට ලක්වීම ද වර්තමානයේ එළැඹෙන අර්බුද කළමණාකරණයේ දී අවධානය යොමු කළ යුතු පැත්තකි. ආර්ථිකය ගෝලීයකරණය වී ඇති අතර සමාජය ගෝලීයකරණය වීමේ යථාර්ථයට මුහුණ දෙන්නට සිදුවන්නේ මෙවැනි වටපිටාවක් සමගය.

ගෝලීය ආර්ථිකය අපට අලුත් දෙයක් නොවේ. මතක ඇති මෑත කාලය තුළ මෙරට දරුවන් සෙල්ලම් කරන්නේ චීනයෙන් ආනයනය කළ සෙල්ලම්බඩු සමගය. මහජනතාවගේ නිවසේ ඇති ගෘහ විදුලි උපකරණ වලින් වැඩි කොටසක් කොරියාවේ නිපදවන දේය. තිරිඟු පිටි ඇමරිකාවෙන් ගෙන්වන අතර ආහාරයට ගන්නා තවත් දේ ලෝකයේ නොයෙක් රටවලින් මෙරටට ගෙන එති. ඉන්ධන ආනයනය කරන්නේ ඉරානයෙනි. ලෝකයේ ඕනෑම රටක මෙරට නිෂ්පාදන තිබේ. ඇමරිකාවේ හෝ බ්‍රිතාන්‍යයේ සුපිරි සාප්පුවක අලෙවි වන ඇඟලුමක සඳහන් වන්නේ එය ශ්‍රී ලංකාවේ නිපදවන ලද බවය. ලංකාවේ ඈත ප්‍රදේශයක නිපදවන ඇඳුමක් බටහිර සුපිරි වෙළඳ සැළක අලෙවි වෙන අතර එහි වෙළඳාම අනුව තමන්ගේ ජීවිතයට හොඳ හෝ නරක ප්‍රතිඵල ලැබෙන බව නොදන්නා පුරවැසියන් ශ්‍රී ලංකාවේ නැත. ආර්ථිකය ගෝලීයකරණය වී ඇත්තේ එසේය.

සමාජය ද ගෝලීයකරණය වෙමින් තිබේ. එය පිළිගැනීමට අප සූදානම් විය යුතුය. රටවල් අතර දේශ සීමා මායිම් මැකී යමින් තිබේ. ශ්‍රී ලාංකිකයන් මිලියනයක් පමණ ලෝකයේ විවිධ රටවල පදිංචිව සිටිති. අධ්‍යාපනය හදාරන්නට, රැකියාවක් කරන්නට හෝ ස්ථිර පදිංචියට විදේශගත වී ඇතත් ඔවුන් මෙරට සමග සම්බන්ධතා අත්හැරදමා නැත. ඉන්දියාවේ මිලියන තිහක් පමණ ලෝකයේ විවිධ රටවල වෙසෙති. චීන ජනගහනයෙන් ද එයට වඩා විශාල පිරිසක් එරටින් බැහැරව ජීවත් වෙති. ලන්ඩන් නගරයේ එක රාත්‍රියකට කතා කරන භාෂා ගණන විශාලය. ඡන්දය හිමි ශ්‍රී ලාංකිකයන්ගේ මතය බ්‍රිතාන්‍යයේ මැතිවරණයක ප්‍රතිඵලය කෙරෙහි තීරණාත්මක වන අවස්ථා වාර්තා විය. මැදපෙරදිග ශ්‍රම බලකාය සම්පූර්ණයෙන් ම පාහේ අත්පත් කරගෙන ඇත්තේ ආසියානුවන්ය.

ජනගහනය දේශ සීමා වලින් තොරව විහිදී පැතිරී සිටිනවා පමණක් නොව විවිධ රටවල වෙසෙන ජනතාව තමන් දරන මතය අනුව ද දේශ සීමා නැති සම්බන්ධතා ගොඩනගා ගෙන තිබේ. එම සම්බන්ධතා වලට මුල් වී ඇත්තේ තොරතුරු තාක්ෂණයේ දියුණුවයි. මානව හිමිකම්, මාධ්‍ය නිදහස හෝ පරිසර හිතකාමී බව ඉලක්ක කරගෙන සමාන අදහස් ඇති පුද්ගලයෝ ඒකරාශී වෙමින් සිටිති. රටවල් අතර ඇති නීති රීති වලින් මත ගොඩනැගීම පාලනය කළ නොහැකිය. එක තැනෙකින් ඇවිලෙන මතයක් ලෝකය පුරා ඇවිල යන්නේ සිතා ගත නොහැකි තරම් වේගයෙනි. සයුර දූෂණය කෙරෙන ඛනිජ තෙල් කාන්දුවක්, ගැන තොරතුරක් වෙබ් අඩවියක් හරහා ලෝකය පුරා පතුරවා එයින් විශාල මතයක් ඇති කරයි. දේශපාලන නායකයෙකුගේ තීරණ අභියෝගයට ලක්කරන විකීලික්ස් වැනි වෙබ් අඩවියක හෙළිදරව්වක් ආණ්ඩු පෙරලන විප්ලවයකට මග පාදයි.

මේ වන විට ලිබියාවේ ඇතිව තිබෙන අර්බුදය මෙම සමාජ ගෝලීයකරණය පැහැදිළිව අධ්‍යයනය කළ හැකි සුවිශේෂී අවස්ථාවකි. මැදපෙරදිග රටවල් ගණනාවක දේශපාලන උණුසුමක් හටගත්තේ නොසිතූ අවස්ථාවකය. ටියුනීසියාව, ඊජිප්තුව, ලිබියාව,යේමනය, සිරියාව ජෝර්දානය හා බහරේන් ඇතුළු රටවල අභ්‍යන්තර ගැටුම් අද ජාත්‍යන්තර සමාජය ඉදිරියේ විවෘතව සාකච්ඡා කරයි. එය තව දුරටත් රටක් තුළ සිදුවන අභ්‍යන්තර සිදුවීමක් නොවේ. මේවා රටවල් අතර හෝ ගෝත්‍ර අතර අභ්‍යන්තරව සිදුවන ගැටුම් වශයෙන් සලකන්නට ගෝලීයකරණයට ලක් වූ අද සමාජය සූදානම් නැත.

රටක පාලනය පුද්ගලයන්ගේ නිදහසට වැදගත් වන අතර එයට බලපෑමක් එල්ල වන අවස්ථාවේ එය නිරාකරණයට මැදිහත්වන්නට, ලෝකයේ වෙනත් රටක පුරවැසියන්ට බාධාවකින් තොරව ඉඩ ලැබී තිබේ. මෙම අවසරය ලැබී ඇත්තේ පිළිගත හැකි නීතියක් අනුව නොවේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය කියා සිටියේ රටක පාලකයන්ගෙන් අයුක්තියක් සිදුවන විට එයට මැදිහත්වන්නට ලෝකයේ සාමය හා සමාදානය අපේක්ෂා කරන රටවලට අයිතියක් ඇති බවයි. එයි අලුත් සම්ප්‍රදායකි. එය කරා දැන් ජාත්‍යන්තර සමාජය ගමන් කරමින් සිටී. වසර හතලිහකට වැඩි කර්නල් ගඩාෆි ගේ පාලනය විදේශ රටවල පදිංචිව සිටින ලිබියානු පුරවැසියන් ප්‍රශ්න කළ අතර අද එය ට එකතු වී විශාල පීඩනයක් මතු කර ඇත්තේ ජාත්‍යන්තර ප්‍රජාවයි. එය කළ හැකි එකක්ද? යුක්තිය කුමක්ද යන ප්‍රශ්නය නොවැදගත් එකක තත්ත්වයට පත්ව ඇත. ඒ තරමට රටවල් අතර දේශ සීමා මායිම් වෙනස් වී ගෝලීයකරණ සමාජයේ ලක්ෂණ සියුම්ව ඇතුල් වී තිබේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානය ලිබියානු නායකයාට එරෙහිව පළමු තීරණය ගත්තේ එහි සාමාජික රටවල සම්පූර්ණ එකඟතාවය ඇතිවය. කලක් ලිබියානු නායක ගඩාෆි සභාපතිධුරය හෙබවූ අරාබි ලීගය ද එය අනුමත කළේය. ගුවන් ආරක්ෂණ තීරණය ගන්නා විට චීනය, ජපානය, ජර්මනිය, බ්‍රසීලය හා ඉන්දියාව වැනි රටවල් ඡන්දය පාවිච්චි කිරීමෙන් වැළකී සිටි නමුත් ඒ රටවල් පවා එයට විරුද්ධතාවයක් දැක්වූයේ නැත. ලිබියානු වැසියන් ආරක්ෂා කිරීම උදෙසා අවශ්‍ය දේ කරන්නට එක්සත් ජාතීන් ගේ සංවිධානය තීරණය කරන විට අනන්‍යතාවයට ගරු කරන, තවත් රටක අභ්‍යන්තර ප්‍රශ්න වලට මැදිහත් නොවිය යුතුය යන සාම්ප්‍රදායික ස්ථාවරයේ සිටි රටවල් බෙහෙවින් මවිතයට පත්විය.

එහෙත් එය යථාර්ථයයි. ලෝකයේ වෙළඳ පොළට හා නිෂ්පාදන අළෙවියට බලපෑම් කරන අන්දමට රටක පාලනයට හා ස්වාධීනත්වයට තවත් රටකට මැදිහත් වන්නට හැකි අන්දමට ගෝලීයකරණ සමාජය නිර්මාණය වී ඇත. සීතල යුද්ධයට පසු පරිවර්තනය වෙමින් පවතින බල අරගලයේ අලුත්ම මුහුණුවර එයයි.

ශ්‍රී ලංකාව වැනි කුඩා රටවලට මෙයට එරෙහි වන්නට අවස්ථාවක් නැත. මෙය අසාධාරණ එකක් බව නිගමනය කළ හැකිය. තවත් රටක පාලනයට මැදිහත් වන්නට එහි පුරවැසියන්ට විනා වෙනත් රටක හමුදාවට ඇති අයිතිය කුමක්දැයි ප්‍රශ්න කළ හැකිය. ලිබියානු ආධිපත්‍ය බිඳ දමමින් ගුවන් ප්‍රහාර එල්ල කරන්නට එක්සත් ජාතීන් ගත් පියවර සාධාරණ දැයි සිතෙන්නට බැරි නැත. ජාත්‍යන්තර ප්‍රජාව අපේක්ෂා කරන යුක්තිය, සාධාරණත්වය මෙය දැයි අපට දැනෙන්ට ඉඩ තිබේ. එහෙත් අද අප හමුවේ ඇත්තේ යථාර්ථයයි. ලෝක ස්වභාවයයි. මැදහත්ව විමසා බලන විට එයට එරෙහිව අරගලයකට යාමට අපට හැකියාවක් නැත. ලෝකයේ රටවල් විශාල ගණනකට අත්ව ඇත්තේ එකී ඉරණමට මුහුණ දීමය. උපේක්ෂා සහගත විය යුතුය. මැදහත් විය යුතුය. නම්‍යශීලී විය යුතු අවස්ථාව හා දැඩි පිළිවෙතකට යා යුතු අවස්ථා හොඳින් හඳුනාගත යුතුව ඇත.

ජාත්‍යන්තරය පසුවන්නේ මෙම අලුත් යුගයක බව තේරුම් ගත යුතුය. සීතල යුද්ධය පැවති ලෝක වාතාවරණයට වඩා මෙම වාතාවරණය වෙනස්ය. රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා වෙනස් මුහුණුවරකින් පවතී. මේ ගැන සියුම් ව අධ්‍යයනය කිරීම කාලීනව වැදගත්ය. ආර්ථික වශයෙන් ගෝලියකරණයට ලක්වූ වර්තමානය සමාජයයීය වශයෙන් ගෝලීයකරණය වෙමින් පවතින විට එයට සාර්ථකව මුහුණ දීම ශ්‍රී ලංකාවේ ද වගකීමකි.

ජාත්‍යන්තර ව්‍යුහය වෙනස් වන විට එහි බලපෑම් තියුණු වන විට අභ්‍යන්තර අරගල වලට මුහුණදීම පවා සියුම් හා මධ්‍යස්ථ ප්‍රතිපත්තියකින් කළ යුතු බව පැහැදිලිය. අද ලෝකයේ අදහස් මතුවන්නේ ජනතාව නගන මත සමගය. තරුණයන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම එයට පදනමක් වී තිබේ. ආණ්ඩු වල තීරණ අභියෝගයට ලක්කරන ස්වේච්ඡා සංවිධාන, ප්‍රජා සංවිධාන මේ සමග බිහිවී ඇත. එය නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ තවත් පැත්තකි. මහජනතාව පත් කරන නියෝජිතයන්ගේ තීරණ සියුම් අභියෝගයට ලක් කිරීමකි. ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය අවසන් කරන්නට සමත් වූ නමුත් රටතුළ යුධ අපරාධ මානව හිමිකම් කඩවීම් ගැන ලෝකයේ නොයෙක් තැන් වලින් නැගෙන චෝදනා වලට පදනමක් වී ඇත්තේ ද මේ සමාජ ගෝලීය කරණයේ ප්‍රතිඵල බව නොරහසකි. එය සියුම්ව අධ්‍යයනය කළ යුතු මෙම සමාජ ගෝලීයකරණයේ තවත් පැත්තකි.